RARE

# "පවුලේ දරුවන් සංඛ්‍යාව පිළිබඳ අඹුසැමි ආකල්ප"

ශ්‍රී ලංකාවේ විවිධ වාර්ගික පවුල් ඇසුරින් කරන ලද සුවිශේෂ අධ්‍යයනයකි

නම ආර් වී පී රාජපක්ෂ
ශිෂ්‍ය අංකය පීඊඕපී/99/024/ආර්

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
සමාජ විද්‍යාපති(භූගෝල විද්‍යාව)
උපාධි පරීක්ෂණයේ පාර්ශවීය අවශ්‍යතාවයක්
සම්පූර්ණ කිරීම සඳහා ඉදිරිපත්කරන ලද පර්යේෂණ
නිබන්ධිකාවකි

ප්‍රවේශ අංකය 342
වර්ග අංකය

කැලණිය විශ්වවිද්‍යාලය
ශ්‍රී ලංකාව

## අධ්‍යයනයේ සාරාංශය

රටක ජන සංඛ්‍යාවේ විශාලත්වය තීරණය කරන ප්‍රධාන සංරචක වශයෙන් සාඵල්‍යතාවය, මර්තියතාව හා සංක්‍රමන හඳුනාගත හැකිය. මෙම ප්‍රධාන සාධක අතුරින් ද මර්තියතාව හා සංක්‍රමන යන සාධක අභිබවා ජන සංඛ්‍ය වර්ධනය සඳහා ප්‍රබලව බලපාන තීරණාත්මක සාධකය ලෙස සාඵල්‍යතාවය හඳුනාගත හැකිය. පසුගිය දශක තුනක පමණ කාලපරිච්ඡේදය තුළ ශ්‍රී ලංකාවේ ද මානව සාඵල්‍යතාවයහි සැලකිය යුතු පහත වැටීමක් සිදු වී ඇත. විශේෂයෙන් නිදහස ලැබූ දින සිට මෙරට ක්‍රියාත්මක කරන ලද විවිධ ජනගහන ප්‍රතිපත්ති හා වැඩ සටහන් මේසඳහා හේතු වී ඇති අතර මෙරට ජනතාවගේ භෞතික ජීවන තත්ත්වයන් සඳහා ද මෙම ප්‍රතිපත්ති හා වැඩ සටහන් හේතු වී ඇති බව පැහැදිලිය. සාඵල්‍යතා මට්ටම් සීග්‍රයෙන් හීනවෙමින් පැවතිය ද තව දුරටත් අධික ජන ඝනත්වයක් ඇති රටක් ලෙස ශ්‍රී ලංකාව හඳුනාගෙන ඇත. විශේෂයෙන් වාර්ගික ජන සංයුතියක් හා බහු ආගමික ජන සමාජයක් ඇති රටක් ලෙස පසුගාමී ජන කොටස් අතර තවදුරටත් සිදුවන පාලනයකින් තොර ජන ගහන වර්ධනය සංවර්ධන ක්‍රම සම්පාදනයේ දී ගැටලුවක් බවට පත් වී ඇත. මෙලෙස අහිත කර ලෙස ජනගහන වර්ධනය සිදු වුවහොත් ආර්ථික, සාමාජික හා සංස්කෘතිකසංවර්ධනයට ද එමෙන්ම දේශපාලනික ස්ථාවරභාවය සඳහා ද අහිත කර ප්‍රතිඵල එල්ලවනු ඇත. එබැවින් ඉදිරියට ද ජනගහන වර්ධනය පාලනයකින් තොරව සිදු වුවහොත් එහි ප්‍රත්ඵල ලෙස ජනතාවගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සඳහා ගනුලබන සියලු ප්‍රයත්නයන්ටබාධා පැමිනෙනු ඇත. එබැවින් මෙරට ජනතාවගේ ජීවන තත්ත්වය සම්බන්ධයෙන් ලබාගෙන ඇති ප්‍රගතිය ඒ අයුරින් පවත්වාගෙන යාම සඳහා වත් ජනගහන වර්ධනය මධ්‍යස්ත මට්ටමක පවත්වාගෙන යාමට අඛණ්ඩ ප්‍රයත්නයක් දැරිය යුතුව ඇත. එබැවින් ජන සංඛ්‍ය වර්ධණයෙහි ගැටලු විසදීමේ දී අනාගත සාඵළල්‍යතා මට්ටම් අවම මට්ටමකට පත්කර ගැනීම සඳහා සාඵල්‍යතා මට්ටම්හි විවිධත්වයන්, ස්වරූපයන් හා ප්‍රබලතාවයන් අධ්‍යයනය කිරීම වැදගත්වේ.

මෙම අධ්‍යයනයේ මූලික අරමුණ යොමුකර ඇත්තේ සාඵල්‍යතාවයට බලපාන පවුලක දරුවන් ප්‍රමාණය තීරණය කිරීමේ දී වැදගත්වන එවැනි සාධක කොරහිය. මේඅනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය, නාගරික විවිධ වාර්ගික පවුල් වල පවුලේ දරුවන් සංඛ්‍යාව තීරණය කිරීමේදී ජන විකාශ, සමාජ ආර්ථික හා සමාජ සංස්කෘතික ආශ්‍රයෙන් ජනිත වන්නා වූ ආකල්ප සාඵල්‍යතාවය හැසිර වීමේදී දක්වන ප්‍රබලතාවය, ප්‍රවනතාවය හා ස්වරූපය හා එහි අන්තර් සම්බන්දතාවයඅධ්‍යයනය කරන ලදී. විශේෂයෙන් මෙවැනි අධ්‍යයනයක් තුළින් හඳුනාගන්නා පවුලේ දරුවන් සංඛ්‍යාව පිළිබඳ අභිලාෂයන් පදනම්කොටගත් අනාවැකි අනාගත ජන සංඛ්‍යා ප්‍රතිපත්ති සකස් කිරීමේදී හා ජන සංඛ්‍යා ප්‍රක්ෂේපන සකස් කිරීමේදී බෙහෙවින් වැදගත් වේ.

මෙම අධ්‍යයනයේ දී පූර්ව අවශ්‍යතාවක් ලෙස ලෝකයේ සංවර්ධිත රටවල මෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල විවිධ වාර්ගික කණ්ඩායම් ඇසුරින් සිදුකර ඇති අධ්‍යයනයන් කෙරෙහි අවධානය යොමු කළ අතර එමගින් පවුලේ දරුවන් සංඛ්‍යාව හා ජන

හා ජන විකාශ, සමාජ, ආර්ථික හා සංස්කෘතික සාධක ආශ්‍රයෙන් ජනිත වෙන ආකල්ප අතර ඇති අන්තර් සම්බන්ධතාවයහි ලෝක ස්වභාවය හඳුනාගැනීමට උත්සහ ගන්නා ලදී. එම විමර්ශනයන් තුළින් අනාවරණය කොටගත් තොරතුරු වත්මන් අධ්‍යයනයේදී ශ්‍රී ලංකාවේ තත්ත්වය අවබෝධ කරගැනීම සඳහා බෙහෙවින් වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ස්වභාවය අධ්‍යයනය කිරීම සඳහා ග්‍රාමීය නාගරික සිංහල දෙමළ මුස්ලිම් පවුල් වලින් සසම්භාවිකව තොරාගන්නා ලද කුටුම්භ ආශ්‍රයෙන් ඒකරාශී කළ තොරතුරු හා ව්‍යුහාත්මක සාකච්ඡා මගින් ක්ෂේත්‍රයේදී ගොනු කරගන්නා ලද තොරතුරු (දත්ත) සංඛ්‍යාන විද්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම මගින් විශ්ලේෂණය කරන ලදී.

එම විශ්ලේෂණ ක්‍රම මගින් ශ්‍රී ලංකාවේ ජන විකාශ, සමාජ ආර්ථික හා සමාජ සංස්කෘතික සාධක ආශ්‍රයෙන් ජනිත වෙන ආකල්ප හා පවුලේ දරුවන් සංඛ්‍යාව අතර පවතින අන්තර් සම්බන්ධතාවයෙහි ස්වභාවය අනාවරණය කොට ගන්නා ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය නාගරික වාර්ගික අඹුසැමියන් අතර පවුලේ දරුවන් සංඛ්‍යාවේ ප්‍රමාණය පිළිබඳ මිනුම්වල පැහැදිලි විවිධත්වයක් හඳුනාගත හැකිවිය.

විශේෂයෙන් වාර්ගිකත්ව හැඟීම් හා ආගමික චාරිත්‍ර වාරිත්‍ර වලින් පෝෂණය කරන ආකල්ප මගින් සාඵල්‍යතාවය ධෛර්යමත් කරන අවස්ථාවන්ද අනාවරණය කොට ගත හැකිවිය. ස්ත්‍රියගේ විවාහ ප්‍රාප්ති වයස, අධ්‍යාපන මට්ටම්, ස්වාමිය හා භාර්යාවගේ සේවා නියුක්ති ස්වභාවයන් හා පවුලේ අදායම හා සමාජ තත්වයන් අනුව පවුලේ දරුවන් සංඛ්‍යාව පිළිබඳ වටිනාකම් (Dimension of values) අනුව තම සාඵල්‍යතාවය හසුරුවන බව පොදුවේ දක්නට ලැබුනි. මේ අනුව අධ්‍යාපනය, සේවා නියුක්තිය, ආදායම් කාණ්ඩ සමාජ තත්ත්වයන් උසස් මට්ටම් වලදී අඩු දරුවන් සංඛ්‍යාවක් ලබාගැනීමේ ස්වභාවයක් හා එම සාධකයන්හි පහත් මට්ටටම්වලදි වැඩිපුර දරුවන් ලබාගැනීමේ ස්වභාවයක් අනාවරණය ොකටගත හැකි විය. එහෙත් මෙය සෑම සමාජ ස්ථරයකටම පොදු ලක්‍ෂණයක් නොවුනු අතර ග්‍රාමීය / නාගරික වශයෙන් මෙන්ම වාර්ගික පදනමින් බලනවිට මීට ප්‍රති වරුද්ධ තත්ත්වයන් හඳුනාගත හැකි විය.අභිලාෂී , අපේක්ෂිත, අශාකරන, අවශ්‍ය හා පවුලේ නියම දරුවන් සංඛ්‍යාව පිළිබ අගයන් ග්‍රාමීය නාගරික වශයෙන් මෙන්ම වාර්ගික වශයෙන් ද විවිධත්වයක් දක්නට ලැබුනි. ග්‍රාමීය හෝ වේවා නාගරික හෝ වේවා මුස්ලිම් ජන වර්ගය අතර ඉහළ මාධ්‍ය දරුවන් සංඛ්‍යාවක් හා ග්‍රාමීය හා නාගරික සිංහල ජන වර්ග අතර අවම මධ්‍ය දරුවන් සංඛ්‍යාවක් ද ද්‍රවිඩ ජන වර්ග අතර අතරමැදි තත්ත්වයක් ද දිස්විය. පවුලක දරුවන් සංඛ්‍යාව පිළිබ තීරණ ක්‍රියාත්මක කිරීමේදි සංවිධිත ලෙස ව්‍යාප්ත වූ පවුල් සැලසුම් ක්‍රම ඇති සමාජයකින් ලැබෙන් පිටිවහල ඉමහත්ය. සමස්තයක් ලෙස පවුල් සැලසුම් ක්‍රම පිළිබඳ දැනුම හා භාවිතය ඉහළ ප්‍රතිශතයක් පිළිඹිබු කළ ද ග්‍රාමීය හා නාගරික වශයෙන් මෙන්ම වාර්ගික වශනේ විවිධත්වයක් දක්නට ලැබුනි. විශේෂයෙන් සිංහල අඹුසැමියන් අතර දැනුම හා භාවිතය ඉහළ ප්‍රතිශතයක් හා මුස්ලිම් අඹුසැමියන් අතර අවම දැනුම හා භාවිතයක් අනාවරණය විය. විශේෂයෙන් මේ තත්ත්වය සඳහා ජාතිය හා ආගම වැනි සංස්කෘතික සාධක ද හේතුවී ඇති බව පෙනේ. මේ අනුව ආගමික මතිමතාන්තර වලින් සාඵල්‍යතාවය ධෛර්යමත් කළ අවස්ථා ද හඳුනාගැනීමට අපහසු නොවිය. සාර්ථක පවුල් ජීවිතයක් සඳහා සඵල අඹුසැමි සංනිවේදනය වැදගත් බව පැහැදිලිය. විශේෂයෙන් පවුල් සැලසුම් ක්‍රම භාවිතය හා දරුවන්

සංඛ්‍යාව පිළිබඳ තීරණ ගැනීමේදී එය වැදගත් වේ. එහෙත් යම් යම් වාර්ගික කණ්ඩායම් වල පුරුෂ ප්‍රතිරූපය, පුරුෂ ආධිපත්‍ය හා ස්වාමියා දක්වන ගෞරවය යන සමාජ මනෝවිද්‍යාත්මක සාධක හේතුවෙන් තීරණ ගැනීමේ වැඩි බලය පුරුෂයා සතුවී ඇති බව හඳුනාගත හැකිවිය. විශේෂයෙන් දෙමළ හා මුස්ලිම් අඹුසැමියන් අතර මෙය සුවිශේෂීව අනාවරණය වී. සඵල අඹුසැමි සංනිවේදනයක් සිංහල පවුල් අතර හඳුනා ගත හැකි වූ අතර මුස්ලිම් හා ද්‍රවිඩ අඹුසැමියන් අතර දුර්වල සංනිවේදනයක් ඇති බව අනාවරණය විය.

ශ්‍රී ලාංකික සමාජයේ අතීතයේ සිට මුල් බැසගෙන පැවති පවුලට පිරිමි ළමයකු සඳහා ඇති කැමැත්ත කුමන පදනමක් මත ගොඩ නැගුණත් එය පවුලේ දරුවන් සංඛ්‍යාව පිළිබඳ තීරණ ගැනීමේදී යම් බලපෑමක් කරන බව හඳුනාගත හැකිවිය. ග්‍රාමීයව විවිධ ප්‍රයෝජ්‍යතා, අපේක්ෂාවෙන් විශාල දරුවන් සංඛ්‍යාවක් අගය කළ අතර නාගරිකව විවිධ හේතු මත (දරුවකු සඳහා වන පිරිවැය ඉහළ යාම) කුඩා පවුලක් අගය කරන බව පැහැදිලිවිය.

මෙම අධ්‍යයනය තුළින් අනාවරණය කොටගත් තොරතුරු පරිදි ශ්‍රී ලංකාවේ ග්‍රාමීය නාගරික වශයෙන් මෙන්ම වාර්ගික වශයෙන් ද පවුලේ දරුවන් සංඛ්‍යාව පිළිබඳ අගයන්හි විවිධත්වයක් පවත්නා බව නිගමනය කළ හැක. විශේෂයෙන් ජන විකාශ, සමාජ ආර්ථික හා සමාජ සංස්කෘතික සාධකයන් ඇසුරින් ජනිත ආකල්ප මේ සඳහා හේතුවී ඇති බව පෙනේ. මේ අනුව එකිනෙකාගේ සාඵල්‍යතා තීරණ ගැනීම ආත්මීය ස්වයං මැන බැලීමක් අනුව සිදුවෙන බව අවසාන ලෙස නිගමනය කළ හැකිය.